**<u>ඉතිහාසය - 13 ශ්‍රේණිය</u>**

**ඒකකය 9**

**නිපුණතාවය 9.0- ආගන්තුක සංස්කෘතික ධාරා දේශීය සමාජයට එක් වූ ආකාරය පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි.**

**නිපුණතා මට්ටම 9.1 - බ්‍රිතාන්‍ය පාලනය යටතේ ශ්‍රී ලාංකික සමාජයට එක් වූ නවාංග පෙන්වා දෙයි.**

**9.2 - විදේශීය බලවේග හමුවේ ජාතික නායකයන්ගේ ක්‍රියාකාරීත්වය පෙන්වා දෙයි.**

1.පහත දැක්වෙන මාතෘකාවන්ගෙන් දෙකක් තෝරා ගෙන ඒවා බ්‍රිතාන්‍ය පාලන සමයේ වැදගත් වූ ආකාරය පැහැදිලි කරන්න.

1.බෞද්ධ අධ්‍යාපනය
2.කෘෂිකර්මය හා වාරිමාර්ග කටයුතු
3.අමද්‍යප ව්‍යාපාරය
4.1915 සිංහල-මුස්ලිම් කෝලාහලය
5.වාමාංශික ව්‍යාපාරය

2.ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය පාලනය යටතේ වතු ආර්ථිකයේ ප්‍රතිඵලයක් වශයෙන් ඇති වූ වෙනස්කම් පහත සඳහන් ක්ෂේත්‍ර අතරින් කවර හෝ දෙකක් යටතේ පරීක්ෂා කරන්න.

1.ප්‍රවාහන කටයුතු
2.ආනයන හා අපනයන වෙළෙඳාම
3.ඉඩම් අයිතිය හා භුක්තිය
4.කම්කරු පන්තිය
5.උඩරට සමාජය

3.) 1.) 19 වන සියවස තුළ ශ්‍රී ලංකාවේ වැවිලි කර්මාන්තයේ වර්ධනය සමාලෝචනය කරන්න.
2.)වැවිලි ආර්ථිකය උඩරට ප්‍රදේශයේ ජනතාව කෙරෙහි බලපෑ ආකාරය සැකෙවින් දක්වන්න.

4.ශ්‍රී ලංකාවේ වැවිලි ආර්ථිකයේ සංවර්ධනය පහත මාතෘකා යටතේ පරීක්ෂා කරන්න.

1.කෝපි කර්මාන්තයේ සංවර්ධනයට හා පරිහානියට දායක වූ ප්‍රධාන සාධක
2.වැවිලි ආර්ථිකය යටතේ ඇති වූ ආර්ථික හා සමාජයීය වෙනස්වීම.

5.)19 වන සියවස තුළ වතු වගාවේ ව්‍යාප්තිය ආර්ථික ක්ෂේත්‍රයේ පමණක් නොව සමාජයේද කැපී පෙනෙන වෙනසක් සිදු කළේය.

1.වතු වගාව ව්‍යාප්ත කිරීමට ඉවහල් වූ ප්‍රතිසංස්කරණ යෝජනා ඉදිරිපත් කළ කොමිසම නම් කරන්න.
2.වතු වගාව හා සම්බන්ධ වානිජ භෝග 4ක් නම් කරන්න.
3.වතු වගාව සඳහා ඉඩම් ලබා ගත් ආකාරය කෙටියෙන් දක්වන්න.
4.වතු වගාවෙන් උද්ගත වූ ප්‍රතිඵල ඇසුරෙන් ඉහත දැක්වෙන ප්‍රකාශය සාකච්ඡා කරන්න.

6.) 19 වන සියවසේ දෙවන භාගයේ ඇති වූ ආගමික හා සංස්කෘතික පුනර්ජීවනයේ කැපී පෙනෙන ලක්ෂණ පරීක්ෂා කරන්න.

**සැකසුම - ඩී.එම්.චන්ද්‍රලතා දිසානායක**
**ර/දොඩම්පෙ ශ්‍රී රාහුල මහා විද්‍යාලය.**

**ඉතිහාසය - 12 ශ්‍රේණිය**
**ඒකකය 4**
**නිපුණතාව - ශ්‍රී ලාංකේය ශිෂ්ටාචාරයේ ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා පිළිබඳව අවබෝධයෙන් කටයුතු කරයි.**
**නිපුණතා මට්ටම 4.1 - ප්‍රාග් ඓතිහාසික යුගය පිළිබඳ තොරතුරු විමර්ශනය කරයි.**

1.ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් ජනාවාසයන්හි ස්වභාවය උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

2.ප්‍රාග් ඓතිහාසික යුගය යනුවෙන් අදහස් වන්නේ කුමක්දැයි පැහැදිලි කොට ප්‍රාග් ඓතිහාසික මානවයාගේ ජීවන රටාව කෙබඳුදැයි විමර්ශනය කරන්න.

3.පහත සඳහන් ස්ථාන ශ්‍රී ලංකාවේ සිතියමක ලකුණු කරන්න.

ඉරණමඩු,බුන්දල,පතිරාජවෙල,මිනිහාගල්කන්ද,පාහියන්ගල,පොතාන,අලිගල,මානකුලම්,මාතොට

**සැකසුම - ඩී.එම්.සී.චන්ද්‍රලතා දිසානායක,**
**ර/දොඩම්පෙ ශ්‍රී රාහුල මහා විද්‍යාලය**